**වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය**

----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2011 පෙබරවාරි 25 දින ඉදිරිපත් කරන ලද කෙටුම්පත් අවසන් ගිණුම් පිළිබඳව සෝදිසි පරීක්ෂාවේදී අනාවරණයවූ ගිණුම්කරණ අඩුපාඩු ඇතුළත් වාර්තාවක් 2011 මැයි 31 දින ආයතනයේ උපකුලපතිවරයා ගේ අවධානය යොමුකරන ලද.එම අඩුපාඩු නිවැරදි කර සංශෝධිත ගිණුම් 2011 ජුනි 14 දින ඉදිරිපත් කර තිබුණි.

#### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

------------------------------

2008 අංක 31 දරන වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාල පනතේ 69(2) (අ) වගන්තිය අනුව ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය සතුව තිබුණු ඉඩම්, ගොඩනැගිලි, ඉගැන්වීමේ උපකරණ සහ ලී බඩු ආයතනයට පවරා ගතයුතු වුවද, 2010 දෙසැම්බර් 31 දක්වා පවරා ගැනීම සිදුකර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුව වත්කම් අගය කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

සමාලෝචිත වර්ෂය තුල සත්‍ය වශයෙන් ගෙවීම් කර නොමැති රු.5,040,000 ක් වූ ජෙනරේටරයක් හා රු.10,478,230 ක් වූ ආපනශාලාවේ මුළුතැන්ගෙයි අලුත්වැඩියා කිරීමේ වටිනාකම් ප්‍රාග්ධනිත කර වර්ෂය තුලදී ක්ෂය කර තිබුණි.

1.2.4 **ලැබියයුතු ගිණුම්**

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ණය ගැතියන් සහ ලැබිය යුතු ශේෂ ලෙස දක්වා ඇති රු. 4,973,727 ක මුදලක් අවුරුදු 2 සිට 5 දක්වා කාලය තුල නිරවුල් නොවී පැවති බව නිරීක්ෂණය විය.

(ආ) නොරාඩ් ව්‍යාපෘතියෙන් ලැබියයුතු රු. 3,722,630 ක මුදලක් වසර දෙකක පමණ කාලයක සිට නිරවුල් නොවී පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ සේවය කර ඉවත්වූ නිලධාරීන්ගෙන් ලැබියයුතු රු.146,588 ක ආපදා ණය, විශේෂ හා උත්සව අත්තිකාරම් මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

1.2.5 **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|
| **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ)</u>** | |
| මු.රෙ 371 | අදාල කාර්යය නිමකළ විගසම අත්තිකාරම් මුදල් නිරවුල් කළයුතු වුවත්, අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමේදී ප්‍රමාදය දින 39 සිට 55 දක්වා විය. |

<u>රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u>

| | |
|---|---|
| 2004 ජූලි 29 දිනැති අංක පීඊඞී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ අනුව අනුමැතිය ලබා නොගෙන රු. 4,110,000 ක මුදලක් ආයෝජනය කර තිබුණි. |

<u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 2004 පෙබරවාරි 24 දින හා අංක 01/2004 දරන චක්‍රලේඛය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.2 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදානයන් ගණන් ගැනීමට පෙර රු. 77,602,043 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපවූ ඉකුත් කාල පරිච්ඡේදයේ ඌනතාවය රු. 23,719,780 ක් විය. සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු. 74,664,000 ක පුනරාවර්ථන වියදම් සඳහා වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු ඌනතාවය රු. 2,938,043 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් කාල පරිච්ඡේදයේ ලැබී තිබුණ රු. 19,900,000 ක පුනරාවර්ථන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු ඌණතාවය රු. 3,819,780 ක් වී තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

#### (i) දේශන පැවැත්වීම

ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා කථිකාචාර්යවරු 10 දෙනෙකු සහ ගුරු සහකාරවරු 27 දෙනෙකු සේවයෙ යෙදී සිටින අතර එම අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශන පැවැත්වීම පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විෂයමාලා පිළියෙල කිරීමට අමතරව 2010 වර්ෂයේ දේශන පැවැත්වීම පිළිබඳ පරීක්ෂාවේදී දේශකවරු ඉතාම අඩු දේශන පැය ගණනක් සිදුකර ඇති බවත් තවත් කොටසක් කිසිදු දේශනයක් පවත්වා නොමැති බවත් නිරීක්ෂණය විය.

(ආ) 2010 ජනවාරි සිට 2010 අගොස්තු දක්වා පශ්චාත් උපාධි කටයුතු සඳහා විදේශගතවූ ගුරු සහකාරවරු තිදෙනෙනකු කරවූ කිසිදු දේශනයක් පවත්වා නොතිබුණි.

**(ii) පාඨමාලා පරීක්ෂාව**

---------------------

(අ) ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා (NDET) විදුලි සහ විද්‍යුත් පාඨමාලා පාඨමාලාව සඳහා දේශන පැවැත්වූ බවට පැමිණීමේ ලේඛන වලින් තහවුරු නොවූවද දේශකවරුන්ට වැටුපට අමතරව දේශන පැය ගණන අනුව රු. 360,924 ක් දීමනා ලබාගෙන තිබුණි.

(ආ) ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDET) සිවිල, විදුලි සහ විද්‍යුත්, විද්‍යුත් හා මිකැනිකල් පාඨමාලා සඳහා කාල සීමාව වසර දෙකක් වුවද 2008 - 2010 දක්වා කාලපරිච්ජේදය වෙනුවෙන් රු. 180,000 ක සම්බන්ධීකරණ දීමනා ලබාගෙන තිබුණි.

.

(ඇ) විභාගය සඳහා පෙනීසිටීමට පෙර සම්පූර්ණ පාඨමාලා ගාස්තු ගෙවා නිම කළ යුතු වුවද පාඨමාලා ගාස්තුව සම්පූර්ණයෙන් ගෙවා නොමැති සිසුන්ද විභාගයට පෙනීසිට තිබුණි.

(ඈ) පරිගණක අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

----------------------------------------------------

මෙම පාඨමාලාවට අදාල 2010 වසරේ පැමිණීමේ ලේඛන පරීක්ෂාවේදී අනුමත පැය ගණන හා පැමිණීමේ ලේඛන අනුව පැය ගණන අතර පැය 5 සිට 78 ක පරාසයක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඉ) පරිගණක දෘඩාංග පිළිබඳ ඉංජිනේරු ජාතික සහතිකය

----------------------------------------------------------

2009 ජනවාරි 02 දිනැති පුවත්පත් දැන්වීමට අනුව මෙම පාඨමාලාව පැය 100 ක් පැවැත්විය යුතු වුවත් එම පැය 100 සඳහාම පැමිණීම් ලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) (i) ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා (NDET) විදුලි හා විද්‍යුත් හා සිවිල් පාඨමාලාවල I හා II සමාසිකවල පළමුවරට පෙනීසිටි සිසුන්ගේ විභාග ප්‍රතිඵල අසතුටුදායක තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පාඨමාලාව | සමත් | අසමත් | නොපැමිණි |
|---|---|---|---|
| **ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා - විදුලි හා විද්‍යුත්** | | | |
| පළමු සමාසිකය | 04 | 17 | 02 |
| දෙවන සමාසිකය | 0 | 19 | 04 |
| **ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - සිවිල්** | | | |
| පළමු සමාසිකය | 03 | 26 | 01 |
| දෙවන සමාසිකය | 07 | 16 | 07 |

ii. ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව, (NDET) මිකැනිකල් සහ විදුලි විද්‍යුත් යන පාඨමාලාවල නියමිත දේශන පැය ගණන සහ විගණනයට ලබාදුන් සිසුන්ගේ පැමිණීමේ වාර්තා සමඟ සසඳා බැලීමේදී අනුමත දේශන පැය ගණන ආවරණය වී නොතිබුණි.

iii. National Diploma in Engineering Technology (Civil) පාඨමාලාව සඳහා පැමිණීමේ වාර්තාවන් ඉදිරිපත් නොකළ හෙයින් අනුමත දේශන පැය ගණන සත්‍ය වශයෙන් පැවැත්වූයේද යන්න තහවුරු කරගත නොහැකිවිය.

iv. විගණනයට ලබාදුන් තොරතුරු අනුව පවත්වන ලද දේශන පැය ගණන හා විභාග ප්‍රතිඵල සැසඳීමේදී ප්‍රමාණවත් පරිදි දේශන ආවරණය නොවූ විෂයයන්ගේ ප්‍රතිඵල අසතුටුදායක බව නිරීක්ෂණය විය.

| විෂයය | නියමිත දේශන පැය ගණන | පැවැත්වූ දේශන පැය ගණන | ඉදිරිපත් වූ සිසුන් සංඛ්‍යාව | අසමත් සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| Analog Electronics | 75 | 06 | 19 | 16 |
| Telecommunications | 75 | 31¾ | 19 | 15 |

2.2.2 කාර්ය මණ්ඩලය

------------------

කළමනාකරණ දෙපාර්තමේන්තුව අනුමත කරන ලද සහකාර මූල්‍ය අධිකාර් තනතුරු 2 ක් වුවද එම තනතුරු සඳහා තිදෙනෙකු පත්කර සමාලෝචිත වර්ෂයේ රු. 301,740 වැඩිපුර ගෙවා තිබුණි.

2.2.3 පාලක මණ්ඩල රැස්වීම්

----------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 17 වගන්තිය අනුව පාලක මණ්ඩල 20 දෙනෙකුගෙන් සමන්විත වන අතර රැස්වීම් වලට සහභාගිවීම් සාමාන්‍යයෙන් 11 ක අවම මට්ටමක පැවතිණි. මේ අනුව ආයතනයේ කාර්යයන් මෙහෙයවීම හා තීරණ ගැනීම ආදී වැදගත් කාර්යයන් ඉටු කිරීමේදී සියළු සාමාජිකයන්ගේ දායකත්වය ඵලදායී ලෙස ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

2.2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

2010 පෙබරවාරි 26 දින රත්මලාන මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුමෙන් එම ශාඛාවේ ඇති ආයතනයේ ව්‍යාපෘති කටයුතු පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමකට නිසි අනුමැතියකින් තොරව රු.906,000 ක මුදලක් මාරුකර තිබූ අතර එම වරද නිවැරදි කර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

2.2.5 ඌන උපයෝජිත වත්කම්

------------------------------

TEDP ව්‍යාපෘතියෙන් 2010 නොවැම්බර් 26 දින ලැබුණු, එකක් රු. 1,199,900 ක් වටිනා කලර් ප්‍රින්ටර් 4 ක් හා රු. 660,800 ක් වටිනා Heat Press Bredermann BVP 2T මැෂින් එකක් 2011 මැයි 09 දින වනවිටත් භාවිතා කිරීමකින් තොරව ගබඩාවේ පැවතිණි.

3. පද්ධති හා පාලන.

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර තාක්ෂණ විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) දේශන පැවැත්වීම

(ආ) පාඨමාලා පැවැත්වීම

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) අත්තිකාරම්